# නර්තනය - 7 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය

## ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල

**නර්තනය** **අංක - ②** **7 ශ්‍රේණිය**

**ඒකකය :- 1.1 වැස්සේ අසිරිය ප්‍රදර්ශනය කරමු.**

**වැසි දිනක දක්නට ලැබෙන ලක්ෂණ**





අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ
හෝ හෝ හෝ ගා ගෙන එන්නේ
ගස් වැල් පෙරලෙන්නේ

සුළං තදයි විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහා වළාකුලක් මේ එන්නේ

අක්කේ වී පැදුරත් මිදුලේ
අකුලා ගෙට ගන්නේ........//
අම්මත් අර නාගෙන එන්නේ......//
මල්ලි තවම කුඹුරේ.....//

සුළං තදයි......

නංගි සුදෝ මගෙ අඬන්නෙපා
අම්මා හනික දැන් එයි.....//
බිල්ලෝ නොවෙයි ඔය ගොරවන්නේ....//
අහසේ හෙණ නාදේ...

සුළං තදයි......

අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙනවනේ....//
වතුරත් ඉවරයි කළ ගෙඩියේ....//
හනික ළිඳට යමුකෝ....//

සුළං තදයි......

❖ ගීතය ගයද්දී වැසි දිනක් සිහියට නඟමින් වැස්සේ අසිරිය සෞන්දර්යාත්මකව විඳින්න.

❖ You Tube හි ඇති ගීතයට සවන් දෙන්න.

❖ **ගීතයේ සඳහන් පරිදි වැසි දිනෙක දක්නට ලැබෙන ලක්ෂණ වගු ගත කරන්න.**

**සුළං හැමීම / කුඹී ගුලක් විසිරීම / මෙරුන් පියඹා යාම / විදුලි කෙටීම / ගෙම්බන්ගේ කෑගැසීම / විදුලි කෙටීම / වැහිලිහිණියන් අහසේ පියඹා යාම / අහස ගෙරවීම / ගස්වැල් පෙරලීම / වතුර ගලා යාම**

| ගීතයේ සඳහන් ලක්ෂණ | ගීතයට අමතරව ඔබ දකින ලක්ෂණ |
|---|---|
| 1) ගස්වැල් පෙරලීම. | 1) කළු වළාවෙන් බරවීම. |
| 2) | 2) |
| 3) | 3) |
| 4) | 4) |
| 5) | 5) |
| 6) | 6) |

## ක්‍රියාකාරකම

❖ වැස්සක අසිරිය ඉහත ගීතයට අනුව නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.

❖ අවස්ථා නිරූපණය සඳහා පහත චලන යොදාගන්න.

- සුළඟ - කැරකීම
- ගස්වැල් ඇඹරීම - එකතැන දෑත් ඔසවා දෙපැත්තට වැනීම
- විදුලි කෙටීම - පැනීම
- හෙණ හඬ - මුහුණින් භය නිරූපණය
- වතුර ගලා යාම - බිම පෙරලීම, දෑත් චලනය, සුරල් පෑගීම